කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

(2010 මැයි / ජූනි)

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ දර්ශනය -BUPH- E2025

# බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

1. බුද්ධකාලීන භාරතීය සමාජ සංවිධානය ගොඩනැගී තිබූ ආකාරය කෙටියෙන් දක්වන්න..

2. ස්වජාතිමය ලක්ෂණ අනුව මානව වර්ගයා කුල වශයෙන් වර්ගීකරණය නොකළ හැකි බව බෞද්ධ මූලාශ්‍රය නයින් පෙන්වා දෙන්න.

3. ගෘහස්ථයකු විසින් ආර්ථික සමෘද්ධිය ඇති කර ගත යුතු ආකාරය කෙටියෙන් දක්වා, ආර්ථික දියුණුව නිෂ්ඨාවක් ලෙස නොසැලකිය හැක්කේ කවර හෙයින් දැයි බෞද්ධ ඉගැන්වීම්වලට අනුව පැහැදිලි කරන්න.

4. ස්වාමි භාර්යා සම්බන්ධය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පවුල් ජීවිතයේ සාර්ථකත්වය කෙරෙහි උපයෝගී කරගත හැකි අයුරු පරීක්ෂා කරන්න.

5. බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්මවල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න.

6. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව, අපරාධ සංඛ්‍යාවට ගැනෙන ක්‍රියාකාරකම් කෙටියෙන් හඳුන්වා, බෞද්ධ දඬුවම් ක්‍රමය පුද්ගලයා වරදින් යහමගට ගැනීම අරමුණු කොට ඇති අයුරු පැහැදිලි කරන්න.

7. ආත්මවාදය යනු කුමක්දැයි පැහැදිලි කොට විශ්වය තුළ ආත්මීය පදාර්ථ නො පවත්නා බව බුදුසමය අවධාරණය කරන ආකාරය පරීක්ෂා කරන්න.

8. පුනරුත්පත්තිය, කර්මය හා විපාකය අස්තිත්වයෙන් පිළිගැනීම ආචාරධර්ම සංරක්ෂණයෙහි ලා උපයෝගී වන අයුරු විමසීමට ලක් කරන්න.

9. මෝක්ෂය පිළිබඳ වෛදික-උපනිෂද් ඉගැන්වීම් හා බෞද්ධ නිර්වාණ පරමාදර්ශය අතර වෙනස පැහැදිලි කරන්න.

10. සත්වයාගේ සාංසාරික පැවැත්ම පිළිබඳ බුද්ධකාලීන භාරතීය සමයාන්තර චින්තා හා බෞද්ධ ඉගැන්වීම් අතර වෙනස පැහැදිලි කරන්න.

**********************